**2021ජුනි මස 30 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021ජුනි මස මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රත්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩි.තාරක මුණසිංහ මහතා විසින් 2021.06.30 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම අද දිනයේ සභාව කැඳවීමට ප්‍රමාද වීමේ හේතුව කොවිඩ් වසංගතය නිසා බව අපි කවුරුත් දන්නවා. සභාවේ අද දිනයේදි අසුන් පිලියෙල කිරිම අනුව අසුන් ගන්නා ලෙස පළමුවෙන්ම කාරුණිකව ඉල්ලා සිටිනවා. එය අතුරු ව්‍යවස්ථාවේ වගන්ති ප්‍රකාරව තමන්ගේ ආසනය මත අසුන් ගැනිම සිදු කරන්න.මේ සම්බන්ධව මන්ත්‍රීවරු අදහස් දක්විමක් කල යුතු නැහැ.අදහස් දැක්විමට ප්‍රමාණවත් කාලයක් නැහැ. ඒ නිසා කාරුණාකරලා ඉද ගන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අදහස් ප්‍රකාශ කිරිමක් නොවෙයි මේ සභාවේ දැනටමත් ස්ව කැමැත්තෙන් තමන්ගේ අසුන

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, කැමැත්තෙන් අසුන් පනවන්න කාටවත් පුලුවන් කමක් නැහැ.කරුණාකරලා තමන්ගේ ආසනයේ ඉදගන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,එහෙම නම් ඒක නිවැරදි කරන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන ඒක මට පුලුවන් කමක් තිබුනොත් පුලුවන්. අසුන් පැනවිම ඒහෙම කරන්න බැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැනටමත් ජොෂ්ඨත්වය මත බලනවා නම් නිශාන්ත මන්ත්‍රීතුමා ඉන්න ඕනෑ ඉදිරි ආසනවල.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමා මට උගන්වන්න එන්න එපා ඒක. සභාව අසුන් පැනවීමේදි අපි ඒතුමාගෙන් විමසීම කලා. ඒහිදි නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රීතුමා සම්ප්‍රදායක් ලෙස කරගෙන ආපු ඒක ඒහෙම හොඳයි කියලා කිව්වා.

<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එහෙම තමයි අපිත් කියන්නේ අපිටත් ඒ විදියට අපේ කැමැත්ත අනුව දෙන්න කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,අතුරු ව්‍යවස්ථාවේ තියෙන්නේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජ්‍යෙෂ්ඨත්වය පනවන්න. මෙතුමාගේ කැමැත්ත මත අපි එතන හිටියා. හැබැයි අපි කණ්ඩායම ඒකඟතාවය මත

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,ඔබතුමා අතුරු ව්‍යවස්ථාවේ තියෙන නීතිය මට උගන්වන්න එන්න එපා.

- සභා ඝෝෂා-

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා,රීති ප්‍රශ්ණයක් සජිත් මන්ත්‍රීතුමා කියනවා අතුරු ව්‍යවස්ථාවේ තියෙනව කියලා පක්ෂ වලට නැතිව ජේෂ්ඨත්වය පනවන්න කියලා. ඒහෙම තියෙන ඒක පෙන්වන්න කියලා මම කියනවා. සාමාන්‍යයෙන් මේ සභාව යන්නේ සාම්ප්‍රදායානුකූලව. සම්ප්‍රදායට අසුන පනවන ක්‍රම දෙකක් තියෙනවා. ඒකක් තමයි ජ්‍යෙෂ්ඨත්වය අනුව අසුන් පනවන්න පුලුවන්. අනිත් ඒක තමයි ඒ ඒ පක්ෂ අනුව වාඩි කරවන්නත් පුලුවන්. මෙතෙක් කල් ජනතා විමුක්ති පෙරමුණ අසුන් ගත්තේ ඒ පක්ෂය අනුව තමයි වාඩි වුනේ. අතුරු ව්‍යවස්ථාවේ කියලා නැහැ කොහේවත් පක්ෂයකින් තොරව ජ්‍යෙෂ්ඨත්වය අනුව පනවන්න කියලා

- සභා ඝෝෂා -

අතුරු ව්‍යවස්ථාව අනුව නොවෙයි මෙතෙක් කල් මේ සභාව යන්නේ සම්ප්‍රදායන් අනුව. ඒ නිසා බොරු නීති තර්ක ගන්න එපා. මොකද මෙතන ඉන්නේ, අතුරු ව්‍යවස්ථාව දන්න අයනේ . ප්‍රශ්ණයක් තියෙනවා නම් නගරාධිපතිතුමා එක්ක කථා කරලා ප්‍රශ්ණය බේර ගන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, තමන්ට අදාල ස්ථානයේ අසුන් නොගන්නවා නම් ඒ මන්ත්‍රීවරු දෙපල අද සභාවට පෙනී නොසිටියා ලෙස සලකන්නට වෙනවා.

- සභා ඝෝෂා -

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා,රීති ප්‍රශ්ණයක් මන්ත්‍රීවරයෙකුට ඕනෑම අසුනක ඉඳගන්න පුලුවන් හැබැයි ඡන්දය පාවිච්චි කරන්න බැහැ. කථා කරන්න අයිතියක් නැහැ. ඒ අයිතිවාසිකම් දෙකම වියැකෙනවා තමන්ගේ අසුනේ වාඩිවුනේ නැත්නම්. ඒ නිසා තමන් තමන්ගේ පුටුව ඉද ගත්තොත් විතරයි තමන්ට පුලුවන් වෙන්නේ ඡන්දය පාවිච්චි කරන්න සහ අදහස් ප්‍රකාශ කරන්න.

- සභා ඝෝෂා -

<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,රීති ප්‍රශ්ණයක් අපිට අර්ථ නිරූපනයක් කරන්න කියලා කියනවා ලේකම්ගෙන් .

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සභාවේ මන්ත්‍රීවරුනි, අපිට දේශපාලනමය මතවාද වශයෙන් ජනතාව වෙනුවෙන් කරනු ගැටුම් තිබෙනවා අරගල තිබෙනවා ඒ පිළිබඳ ගැටලුවක් නැහැ. නමුත් අද අපි මේ අමාරුකම් මැද්දේ මේ සභාවට එන්නේ අපේ වගකීමක මැද්දේ තිබෙන මහජනයාට ඉටුකරන කාරණා පිලිබඳව සාකච්ඡා කරලා තීන්දු තීරණ ගන්න. අතුරු ව්‍යවස්ථාවේ විවිධ ආකාරයේ නීති පනවලා තියෙනවා. සම්ප්‍රදායන අනුව යම් වෙනස් කම් ඇතුලෙත් ඒවා සිද්ධ කරගෙන තියෙනවා. හැබැයි මම අහනවා පක්ෂෙත් විපක්ෂයෙත් ඒ හැම දෙනාගෙන ආසනය පිලිබඳ තියෙන ප්‍රශ්ණය ජනතාවගේ ප්‍රශ්ණයක්ද. නගරාධිපතිතුමා විධායක නිලධාරියා විදියට මේ සභාවේ ඔහු අනුගමනය කරන පිලිවෙතක් තියෙනවා නම් ඒ පිලිවෙතේ ආසනය පනවන ආකාරය මම හිතන්නේ කොතන තැන වුනත් අප ඒය පිලිගන්න බාධාවක් වෙන්නේ නැහැ අපේ දේශපාලනයට.අපේ අරමුණට. ඒ නිසා මේ සභාවේ කාලය ගන්න ඒක ආසන පිලිබඳව වාද විවාද කරන ඒක මේ සභාවේ නොකල යුත්තක් විදියට තමයි අපි සලකන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

බාධා කරනවා නොවෙයි ගරු මන්ත්‍රීතුමා, නගරාධිපතිතුමා ඒහෙම කිව්වේ 50% සහභාගි වෙන්න පුලුවන් සභාවට.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලීමක් කරන්නේ අපිට ආසනය පනවන්නේ කොතනද අපි එතන ඉඳගමු. ඒක ජනතාවගේ ප්‍රශ්ණයක් නොවෙයි. ඒම නිසා ඒකඟ වෙලා සභාව කරගෙන යමු.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අතුරු ව්‍යවස්ථාවේ අංක 7 හි තියෙනවා නගරාධිපතිවරයා අනතුරුව නියෝජ්‍ය නගරාධිපතිවරයා ඉන් අනතුරුව සභිකයන් ඔවුන් තෝරා පත් කරන අනු පිලිවෙල නැවත තෝරා පත් කර ගන්නා ලද කලින් සිටි සභිකයින් සම්බන්ධව ඔවුන්ගේ සභාවේ අඛණ්ඩ සභිකයන් විදියට සිටිමෙන් ප්‍රමුඛතාවය අනුව ජොෂ්ඨත්වය දැරිය යුතුය. මෙය පැහැදිලිවම අතුරු ව්‍යස්ථාවේ සඳහන් වෙලා තියෙනවා. ඒ අනුව අපි ඒ අදාල වෙන්නාවූ පක්ෂ වල නියෝජනය අතුරු ව්‍යවස්ථාව අනුව ආසන පනවලා තියෙනවා.නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා කිව්ව වගේම ඒක බාධාවක් කරගන්නේ නැතුව මගේ මේ 19 වන අවුරුද්ද මමත් පලවෙනියා වෙලා ආවම 2002 මම ඉඳ ගත්තේ අතුරු ව්‍යවස්ථාවේ සම්මත වුන පරිදි ජොෂ්ඨත්වය මත මම ඉඳගත්තේ 5

වන පුටුවේ ඊට පස්සේ දිගින් දිගටම මම සභාව මෙහෙවන කොට ආසන පනවල තියෙන්නේ ඒ විදියට. පනවපු ආසනයේ ඉඳ ගන්නට බැරිනම් ඒ දෙකම පෙරලා මට පිලිගන්නට බැරි නිසා ඒය සභාවේ නීතිරිති වලට අනුකුල නොවන නිසා මට ඒ කටයුත්ත කරන්න බැහැ කියලා පලමුවෙන්ම සභාවට දැනුම් දිම කරනවා. ඒ අනුව ඊලඟ පියවර විදියට අද සභාවේ මාධ්‍ය වේදී මහත්ම/මහත්මීන් ඕනකමින් නොගෙනාවා නොවෙයි මේ කොවිඩ් වසංගතය නිසා. අද දිනයේ පත්තරයේ තියෙනවා ඩෙල්ටා වසංගත තත්ත්වයට පත් වෙලා තියෙනවා කියලා. අපේ මොරටුවේ තත්වයත් හොඳ නැහැ. ඒකසිය ගනනක් මිය ගිහින් තියෙනවා.සභාවේ මේ අසුන් වල සිටින අය පිලිවෙලට 50%ක් සේ සලකලා කරුණාකරලා අසුන් ගන්න. තමන්ට ඕනම වෙලාවක මේ සභාවේ කවුරු හෝ යනවානම් ඒ වෙනුවට නියෝජනයක් කරන්න පුලුවන් පුලුවන්. සභාවේ 50% ක් නියෝජනය ඇතුව තමන්ගේ නියමිත ආසනයේ ඉන්න.

## 01. වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.

2021.05.18 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිවරුනි, මහ සභා වාර්තාවේ මන්ත්‍රිධුර නාම ලේඛණයේ අංක 15 ලෙස සඳහන් වෙලා තිබෙන මහ නගර සභා මන්ත්‍රි ඒස්.ඩබ්.ඒම්.නීෂා ඉරානි විජේවික්‍රම මහත්මියගේ නම මුද්‍රණ දෝෂයකින් සඳහන් වෙලා තිබෙන්නේ ඒතුමිය ඒ වන විට නිරෝධානය වෙමින් නිවසේ සිටි නිසා ඒ නම ඉවත් කිරිමට අදාල සංශෝධනයට යටත්ව වාර්තාව ඉදිරිපත් කරනවා.

**මහ නගර සභා මන්ත්‍රි - ඒල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2021.05.18 දින සභා රැස්විම් වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

**මහ නගර සභා මන්ත්‍රි - ඒ.රවිනාත් ගුණසේකර මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ වාර්තාව සම්බන්ධව වචනයක් ප්‍රකාශ කරනවා. මම සභාවේ කථා කරපු යම් දේවල් හරියාකාරව වාර්තා වෙලා නැහැ. ඒක ප්‍රශ්ණයක් කර ගන්න අවශ්‍ය නැහැ. නමුත් මම අවධාරණය කරනවා ඒ ගැන සැලකිලිමත් වන ලෙස ඉල්ලා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රි එෆ්.බී.නිලංක සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.05.18 දින පැවති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන

### 2(1) නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිවරුනි,ජුලි මාසයට නියමිත මහ සභා රැස්විම 2021 ජුලි මාසයේ 20 වන දිනටත්,මුදල් කමිටුව ජුලි මාසයේ 02 දිනටත් යෙදි තිබෙන බව දන්වා සිටිනවා.

## 03. සභාව අමතා ඒවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

**03(1) මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග එන් අපොන්සු මහතා**

ගරු නගරාධිපතිතුමා, වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න ඉල්ලා සිටිනවා. මේ කොවිඩ් වසංගතය දිනෙන් දින ව්‍යාප්ත වන මොහොතේ මොරටුව මාසික සභාව පැවැත්වීමට නිලධාරින් සීමාවක් කරගෙන මන්ත්‍රීවරුන් සීමාවක් කරගෙන අද දින මේ සභාව පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබෙනවා. මේ මොහොතේදි සභාව පැවැත්වීමට සුලු මොහොතකට පෙර මොරටුව මහ නගර සභාවේ ආරක්ෂක අංශයේ නිලධාරි මහත්මයෙකුට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී සේනක දමයන්ත ද සිල්වා මැතිතුමා පහර දීමක් සිදුකර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපගේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරනවා ඒ සිදුවීම සම්බන්ධයෙන්. ගරු නගරාධිපතිතුමනි මේ වසංගත කාල තත්වයට මුණ දිලා මොරටුව ජනතාවගේ ප්‍රශ්ණ කථා කරන්න මොරටුව මහ සභාවට ඒන මොහොතේදි සියලුම දෙනාගේ ආරක්ෂාව පිණිස සේවක මහතුන් රැදි සිටින්නේ. ඒම නිලධාරින්ට පහර දිම සම්බන්ධයෙන් දැඩි ලෙස හෙලා දකිමින් ශ්‍රී ලංකා පොදුජණ පෙරමුණ විදියටත් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරනවා.

**03(2) මහ නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි පසුගිය මැයි මස 28 වන දින ඒන්නත් කරණය සම්බන්ධ සිද්ධියකදි ඔබතුමා ඉතාමත් අවාසනාවන්ත ලෙස ඉතාම කණගටුදායක අවස්ථාවකට මුණ දුන්නා. අපි විශ්වාස කරනවා එය අධිකරණය වෙත නිවැරදිව කරුණු වාර්තා නොවි වෙනත් ආකාරයට කරුණු වාර්තා වීම නිසා ඒ කාරණයට ඔබතුමා මුණ දුන්නා කියලා. එය තවමත් අධිකරණ කාරණයක් නිසා අපි ඒක පිලිබඳව දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් එම කාල පරිච්ඡේදය ඇතුලතදි ගරු නගරාධිපතිතුමනි මාධ්‍ය හා අනිකුත් අය අතර විශාල කසුකුසුවක්ඇතිවුනා මාධ්‍ය වල ප්‍රකාශයට පත් වුනා නගරාධිපතිතුමා සමඟ සිටින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් විපක්ෂයේ වෙනත් මන්ත්‍රීවරයෙක් ඒක්ක ඒකතු වෙලා සාකච්චා කරමින් යනවය ඔබතුමා කෙරෙහි තියෙන විශ්වාසය බිඳ වැටිලා කියන වගේ මතවාදයක් ඇතිවුනා ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා අපි මොරටුව මහ නගර සභාවේ ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා ප්‍රධාන මන්ත්‍රීවරු විසිහත්දෙනෙක්ගෙන් විසිහයදෙනෙක් අත්සන් කලා ඒක්කෙනෙක් දුරකථනයෙන් කථා කරලා කිවුවා ඒතුමා නිරෝධානයට ලක්වෙලා නිසා ඒතුමාගේ ඒකඟතාවයත් ඒක්ක ලිඛිතව ගරු නගරාධිපතිතුමාට විශ්වාසය ප්‍රකාශ කිරිම සම්බන්ධයෙන් ලිපියක් ඉදිරිපත් කරනවා.

**මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමා, මෙය කථා කරන්නේ කොහොමද?

**මහ නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමා, කථා කරන්නේ ආයාචනා පෙත්සම් පැමිණිලි යටතේ.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මොරටුව මහ නගර සභාවේ මන්ත්‍රීවරු 27 දෙනෙක්ගේ ඒකඟතාවය ලිඛිතව අත්සන් සහිතව මම මේ අවස්ථාවේදි ඔබතුමා කෙරේ අපේ විශ්වාසය පල කරමින් ලිපිය සභාගත කරනවා.

**03(3) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,පෙත්සම් හා පැමිණිලි අයිතමය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තියෙනවා. ඇත්තටම මේක යෝජනාවක් විදියට ගේන්න තිබුනා නම් තමයි වටින්නේ නමුත් මට සිදුවුන සිදුවීමක් සම්බන්ධව මුල්කරගෙන තමයි මේ පැමිනිල්ල සිදු කරන්නේ. පහුගිය මාසයකට අධික කාලයක් කොවිඩ් වසංගතය හේතුකොට ගෙන මුලු දිවයිනටම සංචරණ සීමා පනවලා තිබුනා. මේ මාසය ඇතුලත ජංගම සේවා හැර සියලුම කඩ සාප්පු සහ අනිකුත් ඒවා වහලා තිබුනේ. මම මැයි මාසේ මගේ රත්තරං බඩුවක් උගස් තිබ්බා දැඩිගම උගස් මධ්‍යස්ථානයේ සොයිසා පුර ශාඛාවේ. 25 වන දින යම් නිදහසක් දුන්නා. ඒදින ඒය ලබා ගන්න බැරිවුනා දැඩිගම ස්ථානය වහලා තිබුන නිසා.මේ මාසේ 21 වනිදා විවෘත කලාට පස්සේ මුලු මාස දෙකකට විශාල පොලියක් මගේන් අය කලා. මේක සියලුම දෙනාට වුනා.වාහන වල ලීසං මේ සහනය ලබා දෙන්න කියලා තියෙද්දිත් ලබා දෙන්නේ නැහැ. මෙවැනි කරදර කාරි කාලයක ලීසිං වල ඉන්න මුදලාලිලා මේ අසරණ කමින් ප්‍රයෝජන ගන්න ඒක වලක්වන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් මම ගරු අගමැතිතුමාගෙන් මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(4) <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මොරටුව ලලිත කලා සංගමය මට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. කලා භූෂන ටෙනිසන් කුරේ මාවත පිලිබද මතුව ඇති ගැලුව පිලිබදව. ඉහත මතුවි ඇති ගැටලුව පිලිබදව මොරටුව ලලිත කලා සංගමයේ සභාපති තමයි ඉදිරිපත් කලේ.මේකෙන් අදහස් කෙරෙන්නේ නගරාධිපතිතුමා ටෙනිසන් කුරේ මාවත විල්ලෝරාවත්ත ප්‍රධාන පාරක දමන්න කියන ඒක තමයි කියලා තියෙන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා සභාපතිතුමාට ඔය ලිපිය ඒවන්නත් බැහැ. සභාවේ කියන්නත් බැහැ.හේතුව ඔබතුමත් මමත් බැදිලා ඉන්න නීති රාමුවක් තියෙනවනේ.ඒ නීතිරාමුව තුල ඒතුමාට මොකක් ද තියෙන අයිතිය ඒහෙම නොවෙයි මෙහෙම කරන්න කියලා.ඒහෙම ලියන්න ඒතුමාට අයිතියක් නැහැ. සභාවේ ඒකඟතාවය මත නම් කරපු ඒකක් වෙනස් කරන්නේ කොහොමද ඒගොල්ලෝ. අපිට අණපනත් තියෙනවා ඒ අනුව අපි කටයුතු කරන්න ඕන.

**03(5) <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දැන්වසරක් තිස්සේ පවතින මේ කොවිඩ් වසංගතය නිසා ජනතාව අසරණ වෙලා. මමත් පහුගිය කලේ පොසිටිව් වෙලා හිටියා.අද වෙනකනුත් කල්දමුල්ල ග්‍රාමනිලධාරි කොටසට වයස 30-60 අතර ඒන්නත දිලා නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ආයාචනා පෙත්සම් ඉදිරිපත් කිරිමේදි ක්‍රමයක් තියෙනවා ඒ අනුව ඔබතුමා සිදු කරන්න. ඒන්නත් කිරිම ගැන කථා කිරිම මේ වෙනකොට කරන්නේ නැහැ අධිකරණ ක්‍රියාවලියක් තියෙන නිසා. ඔබතුමා ඉන්න තැන තමයි මමත් ඉන්නේ ඒන්නත් කරණය සම්බන්ධයෙන් පොසිටිව් වුන කෙනෙක් විදියට ලොකු අයිතියික් තියෙනවා. ඒක නිසා ඔබතුමා ලිඛිතව ඉදිරිපත් කරන්න.

**03(6) <u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මාධ්‍ය වේදින් වෙනුවෙන් ලබා දෙන සභා වාර්තා හා කමිටු වාර්තා ඔවුන් වෙත ලබා දෙන්න කියලා ඉල්ලීමක් කලා.ඔබතුමාට මතක් කිරිමක් කරනවා.

**03(7)** **<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ වසංගත තත්වය දිනෙන් දින ව්‍යාප්ත වෙමින් පවතිනවා.ජනයා මහත් සේ පීඩාවට පත්වෙනවා. ඔවුන්ගේ වැසිකිලි පිරීයාම සිදු වෙනවා මුදල් අතින් ඔවුන් අසරණ වෙලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.මම මගේ මන්ත්‍රීවැටුපෙන් කැපෙන්න හෝ කරන්න බලාපොරොත්තු වෙනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ඉල්ලීම සම්බන්ධයෙන් නිරෝධායන බෝඩ් ඒක අලවලා තිබෙන නිවසක ඒ වගේ අවශ්‍යතාවයක් තිබුනොත් ඒ අවශ්‍යතාවය නොමිලයේ කරන්න කියලා මම නියෝග කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පලමුවෙන්ම සී.පී.ද සිල්වා මාවතේ තිබෙන නිවසේ ඒ සේවය කරන්න කියන ඉල්ලීම මම කරනවා. ඔබතුමාට බොහෝම ස්තූතියි.

**03(8)** **<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,මේ කොවිඩ් වසංගතය වෙන්වෙන් මෙහෙයුම් කලමනාකරන මධ්‍යස්ථානයක් ස්ථාපනය කර ගතයුතු වෙනවා. මොකද ඉදිරියේද සෞඛ්‍ය අංශ නිළධාරින් කාර්ය බහුල විමත් සමඟ දුරකථනයට ඇහුම්කම් දෙන්න බැරි වෙනවා ජනතාව අපහසුවට පත්වෙන නිසා මෙවැනි මධ්‍යස්ථානටක් ස්ථාපනය කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි මේ වෙනකොට එයට තොරතුරු ඒකතු කරලා සෙන්ටර් ඒක හදලා ඉවරයි. ප්‍රදිප් ශ්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාගේ මුලිකත්වයෙන් සිදු වෙන්නේ.

**03(9)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, මේ දින වල පී. සී.ආර්. කිරිම සහ ඒන්නත් කිරිම සොයිසාපර කොට්ඨාශය තුල සායනය තුල තමයි කාලයක් තිස්සේ සිදුකරන්නේ.තිබෙන ගැටලුව පී.සී.ආර්. කරන්න ඒන පුද්ගලයන් වෙළඳ පොලවල, මාර්ගවල වගේ හැම තැනම ගැවසෙනවා සිගරට් බොනවා. ඒම මාර්ග වල ගමන් කරන මගීන්ට විශාල කරදරක්. කිසිදු පාලනයක් පරිබාහිරව වෙන්නේ නැහැ. සොයිසා පුර ජීවත් වන ජනතාවට මහත් පීඩාවක් සිදු වෙලා තියෙන්නේ මේ හේතුව නිසා.ගරු නගරාධිපතිතුමා,සොයිසා පුර උතුර කොට්ඨාශයට තවම කිසිදු ඉන්නක් ලබා දිල නැති බව ප්‍රකාශ කරනවා.

**03(10)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,ඔබතුමාගේ අවධානය යොමු කරනවා වර්ථමානයේ ජනතාව ඉතාමත් අසරණ තත්වයක ඉන්නේ. රජයෙන් ලබාදෙන රු.5000/- දීමනාව ලැබිලා නැහැ. ඒවගේම ඒන්නත් කරන වැඩපිලිවෙල විවිධ ප්‍රදේශ වලට ඉදිබැද්ද, මොරටුමුල්ල,කඩලාන,පුවක්අරඹ ලැබිලා නැහැ. අදාල ආයතන වලට කථා කලාම කියන්නේ ඒන්නත් නැහැ කියන ඒක තමයි කියන්නේ.ඔබතුමාට සිදුවුන සිද්ධියත් ඒක්ක ඔබතුමාගේ මැදිහත් නොවිම ප්‍රශ්නයක්.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,හෙට දිනයේදි ඉදිබැද්ද නැගෙනහිර, බටහිරට එන්නත් 3000 ක් ලබාදිමේ කටයුත්ත සිදුවෙනවා.

**03(11) <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, බොහොම ස්තුතියි. ඒවගෙම වර්තමානයේ වඩු කාර්මික ජනතාව විශාල අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා අවශ්‍ය සෑම අමු ද්‍රව්‍යයක්ම විශාල ලෙස මිල ඉහල ගිහිල්ලා තියෙනවා. ලී ඇණයේ සිට ගම් ටින් ඒක, සීලර් ඒක සියලුම දේ වල . ඔබතුමාට මැදිහත් වෙන්න පුලුවන් නම් ඒ ජනතාව විශාල ලෙස අසරණ තත්වයට පත් වෙලා තියෙනවා මේ සිද්ධි දාම තුල. ඒ වගේම දැව කඳන් මොරටුවට ගෙන ඒමේදි විශාල ප්‍රශ්ණයකට මුණ පාල තියෙනවා සංචරණ සීමාවේදි. පසුගිය වෙලාවේ ඔබතුමා මැදිහත් වෙලා බලපත්‍ර ලබා දිලා විශාල වශයෙන් මොරටුවට සහනයක් වුනා.

## 04. <u>ප්‍රශ්ණ</u> - නැත

## 05. <u>යෝජනා -</u>

**05(1)** මහ නගර සභා මන්ත්‍රී ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මියවිසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.

“මොරටුව ඉහළ ඉදිබැද්ද බිලාසියුස් පාරේ වරිපනම් අංක 11/1 A දරණ නිවසින් ආරම්භ වී වරිපනම් අංක 11/3 දරණ නිවසින් අවසන් වන බිලාසියුස් පාරේ වමට ඇති පළමු හරස් මාර්ගයේ නිවැසියන් විසින් ප්‍රදේශයට විශාල සේවයක් කර ඇති ටියුඩර් මෙන්ඩිස් මහතාට කරන ගෞරවයක් ලෙස ඒම පාර “ටියුඩර් මෙන්ඩිස් මාවත” නමින් නම් කරන ලෙස යෝජනා කරන්නීය.”
එම යෝජනාව මහ නගර සභා මන්ත්‍රී ඒම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ යෝජනාව මීට පෙරත් සභාවට ඉදිරිපත් වුනා නමුත් අද ඒ යෝජනාව ඉදිරිපත් වෙලා තියෙනවා අපිත් ඉදිබැද්දේ ජීවත් වෙන්නේ නමුත් අපි දන්නේ නැහැ ටියුඩර් මෙන්ඩිස් කියන්නේ කවුද කියලා. ඒවගේම ටියුඩර් මෙන්ඩිස් කියන කෙනා ඔය කියන පාරට දිලා තියෙනවානම් දිලා තියෙන්නේ අඩි දෙකයි. නමුත් ඔය ඉඩමේ වැඩි කොටසක් දිලා තියෙන්නේ යාබද ඉඩමේ අය ඒක නිසා මේක ලොකු ප්‍රශ්ණයක් හේතුව ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මන්ත්‍රීතුමත් මේ යෝජනාවට මැදිහත් වෙලා තියෙනවා. ටියුඩර් මෙන්ඩිස් කියන කෙනෙක් ඒහෙම පුද්ගලයෙක් නොවෙයි අනුවර්ත නාමයක් තමයි ඉදිබැද්දේ ටියුඩර් මෙන්ඩිස් කියන්නේ. ඒ නිසා ජනතාව අපෙන් ප්‍රශ්ණ කරනවා ඒපාරට එවැනි නමක් දාන්නේ ඇයි කියලා. කීප දෙනෙක් අත්සන් කරලා තියෙනවා කියලත් අපිට ආරංචි වුනා. නමුත් මේ ප්‍රශ්ණයේදි ඔය පාර ඔය නමින් නම් කලොත් විශාල ප්‍රශ්ණයක් ප්‍රදේශයේ ජනතාව තුල ඇති වෙනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මන්ත්‍රීතුමාටත් මටත් තිලකසිරි ප්‍රනාන්දු මන්ත්‍රීතුමාටත් මේ පාර සම්බන්ධයෙන් පාරේම ඉන්න අය අපිට පැමිනිලි කරන නිසා මේ යෝජනාව ගැන ජන්දයක් හරි විමසලා ඔබතුමාගේ ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මැක්සි ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේමප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මන්ත්‍රීතුමාටත්, මැක්සි ප්‍රනාන්දු මන්ත්‍රීතුමාටත් , මටත් ඒ ජනතාව කියන දේ තමයි පාරට පුද්ගලයෙකුගේ නමක් නොවෙයි පාරේ පදිංචි කරුවන් කැමතියි බ්ලාසියුස් පාර පලවන පටුමග, දෙවන පටුමග, තුන්වන පටුමග මේ වගේ ඒ අයට නොවෙයි අපිට අවශ්‍යතාවයක් තියෙනවා නම් ඒහෙම දාන්න කියලා. මෙතුමිය යෝජනාව දාලා තියෙන්නේ මෙතුමියගේ කැමැත්තට වෙන්න ඇති මාර්ගයේ පදිචි අයගෙන් කැමැත්තක් අරගෙන නොවෙයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම අත්සන් ලේඛණයක් ඉදිරිපත් කලා. මට ඔය ගැටලුව ඒ අය කිව්වේ නැහැ.මට කිව්වේ පාර හදනකොට ටියුඩර් මැන්ඩිස් මහත්මයා තමයි ඉඩ සලසලා දුන්නේ අපිට ඒ නම තමයි අවශ්‍ය කියලා. මට අවශ්‍ය නැහැ ඒ පාරට නමක් දෙන්න ඒ පාරේ අය තමයි මගෙන් ඉල්ලිම කලේ. මම ඒ සියලුම ලිපි අත්සන් ලේඛණයත් සහිතව ලේකම්තුමාට ඉදිරිපත් කරලා තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා,ඉදිරිපස ටික තමයි ඒ මහත්මයා දිලා තියෙන්නේ. පිටු පස ටික තව දෙනෙක් දිලා තියෙන්නේ අනිත් ඒවා වෙන වෙන අය දිලා තියෙන්නේ ඒහෙම වුනොත් 3-4 දෙනෙක්ගේ නම් දාන්න වෙනවා පාරට.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම විශ්වාස කරනවා ඉල්ලිම ඒ අය අත්සන් කරල භාර දුන්න නිසා විරෝධතා කැඳවීමේදි පිරිසිදු නමක් තිබුනානම් හරි කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, යෝජනාවක් සභාවට ඇතුලත් කරාට පසුව ඒක විවාදයක් ගියාට පස්සේ බෙදිමක් ඇති වුනෙත් ඒ බෙදිම අපි ලබාදිය යුතුයි. සභාවට අයිතියක් නැහැ ඒ බෙදිම ප්‍රතික්ෂේප කිරිමට. එය සභාවේ වගකිම. මේ යෝජනාව භාරව තියෙන්නේ මොරටුව මහ නගර සභාවට. සභාවේ අයිතිය මන්ත්‍රිවරු. මන්ත්‍රිවරුන්ගේ අයිතිය තමයි ඒක අතුරු ව්‍යවස්ථාවෙන් කියලා තියෙන දේ. බෙදිමක් ඉල්ලනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, බෙදිමක් ඉල්ලන්නේ සාධාරණ හේතු නැහැ කියන එකද ?

- සභා ඝෝෂා -

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට ඒක කියන්න බැහැ. සභාවේ මන්ත්‍රිවරු කියනවා නම් බෙදිමක් ඕන කියලා ඒක කරන්න වෙනවා. ඡන්ද විමසිමක් කරන්න වෙනවා. ඒක තමයි නීතිය.

අංක 05(1) දරණ යෝජනාවට පක්ෂව කිසිදු මහා නගර සභා මන්ත්‍රීවරයකු ජන්දය ප්‍රකාශ නොකරන ලදි.

අංක 05(1) දරණ යෝජනාවට විරුද්ධව පහත නම් සඳහන් මන්ත්‍රීවරු ජන්දය ප්‍රකාශ කරන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රත්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිශාන්ත විජේරත්න මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |

අංක 05(1) දරණ යෝජනාව වැඩි ජන්දයෙන් ප්‍රතික්ෂේප විය.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, 13 ඌ වගන්තිය යටතේ යෝජනා දෙකක් තිබෙනවා ඉදිරිපත් කරන්න තියෙනවා ඒ සම්බන්ධයෙන් ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ 13(ඌ) වගන්තිය යටතේ හදිසියේ ගේන්න තරම් යෝජනා නොවෙයි දැනටමත් ක්‍රියාත්මක තත්වයේ තියෙන යෝජනාවල් ඒම නිසා ඒවා ගේන්න බැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,13 ඌ යටතේ ඉදිරිපත් කරලා තියෙනවා යෝජනා දෙකක් ඔබතුමා ප්‍රකාශකලා හදිසි කාරණා නොවන නිසා ගන්නේ නැහැ කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, හදිසි කාරණාවක් නොවෙයි කියලා නොවෙයි දැනටත් ක්‍රියාත්මක දේවල් තමයි තියෙන්නේ.පලවෙනි යෝජනාව මේ වෙනකොට මේකේ අවසානය වෙන්නේ අධිකරණයේ කටයුත්තක් පවතින දේකට මේ වෙනකොට සිද්ධියක් වෙලා තියෙනවා ඒක මෙහි ඉස්මතු වෙලා ඒන්න පුලුවන් ඒක මටද අවාසි වෙන්නේ ඇයටද අවාසි වෙන්නේ කියලා දන්නේ නැහැ ඒ නිසා මම සැලකිල්ලට ගත්ත ඒක කරන්න සුදුසු නැහැ කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම ඔබතුමාගේ මතයට ගරු කරනවා. නමුත් මෙතන තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි, උසාවියේ තියෙන නඩුව සම්බන්ධව කිසිම සඳහනක් මෙතන නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු හිටපු නගරාධිපතිතුමනි මේ සම්බන්ධයෙන්ම තමයි අධිකරණ ක්‍රියාවලිය යන්නේ. ඒක නිසා කරුණාකරලා මේක ඉදිරිපත් කරන්න බැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම ඔබතුමාට තේරුම් කරන්න හදන්නේ මේක කාරනා දෙකක් . ඒකක් තමයි ඔබතුමාට තියෙන්නේ රජයේ නිලධාරියෙකුගේ රාජකාරියට බාධාකිරීමක්. ඒක අපි අමතක කරමු. දැන් මෙතන කියන්නේ ඒ කටයුත්ත කිරීම තුලින් ඇති වුනු යම් ප්‍රශ්ණ නිසා මේ පරිපාලනයේ යම් දුර්වලතාවයන් ඉස්මතුවෙලා තියෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, එම යෝජනාවෙන් තිරණය කරන්න බැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමා ඒක්ක අනවශ්‍ය දේවල් වලට තර්ක කරන්නේ නැහැ.ඔබතුමාට සහයෝගය දෙන්න පුලුවන් හැම වෙලාවෙම දෙනවා. යම් දේවල් තියෙනවා ඒහෙම අවස්ථාවල් තියෙනවා යම් කාරනා ඉදිරිපත් කරන්න පුලුවන්. ඒ කාරනාව පමණයි මෙතන ඉස්මතු කරන්න හැදුවේ. දෙවෙනි යෝජනාව විශේෂයෙන්ම කොවිඩ් සම්බන්ධව. එය ප්‍රශ්ණයක් නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, අනිත් එකත් ඒහෙම තමයි.දැනට ඔබතුමන්ලා කියන දේ සිදුවෙන දෙයක්ද කියලා ජනතාව තින්දු කරනවා නොවෙයිනෙ මේ. මේ ප්‍රශ්ණය නිසාම ගරු හිටපු නගරාධිපතිතුමා මෙය ව්‍යංගයෙන් කටයුතු කිරීම සඳහා ගන්නා ලද යෝජනාවක්.අපිත් ඔතන ඉදලත් තියෙනවා දැන් අවුරුදු ගනනාවක් තිස්සේ මෙතන ඉන්නවා. මේකට බලපාල තියෙන මූලික විදියට නගරාධිපතිවරයා විදියට මම නිසා යම්කිසි අගතියක් වෙලා තියෙනවා කියලා කියනකොට ඔය පැත්තෙන් දැන් මම ගැන කථාකරන්නෙම නැහැ. ඒක නිසා ඒක සැලකිල්ලට ගෙන ඇයටද මටද අසාධාරණය වෙන්නේ කියන ඒක මේකෙන් මතුවෙන්න පුලුවන්. ඒ නිසා මම යෝජනා ගෙනාවේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම දන්න තරමට ඔබතුමාට ප්‍රතික්ෂේප කිරීමට යම් යම් අවස්ථාවල යම් යම් හේතු තියෙනවා. නමුත් ඔබතුමාට මතක ඇති ඔබතුමන්ලා මෙතන ඉන්න කොට අනුෂ ගුණසේකර, හරින් ගෝමස් මොරිස් විජේරත්න ඔබතුමා ඇතුලු කණ්ඩායම මෙතන ඉන්නකොට විපක්ෂය හැටියට කොයි තරම් බාධා කෙරුවද කියලා අපි යම් යෝජනාවක් භාර ගන්න බැහැ කියලා කිව්වම.නමුත් ඒ භාරගන්න බැහැ කියපු හැම අවස්ථාවකදීම ගරු නගරාධිපතිතුමනි යෝජනාව ඉදිරිපත් කලාට පස්සේ දින 2-3 ක් ඇතුලත ලිඛිතව ඉදිරිපත් කෙරුවා මේ යෝජනාව භාර ගන්න බැරි මෙන්න මේ හේතුව නිසා නමුත් ඔබතුමාගෙන් මේවට පිලිතුරු ලැබුනේ ඊයේ

හවස මම පෙන්නුම් කරන්න හැදුවේ මෙතන දි  යම් පරිපාලනමය වශයෙන් ඔබතුමාගේ අවධානට ලක් කිරිමට යම්  කාරනා තිබුනා. දැන් මෙතනදි ගන්න බැරි නම් අපි කොයි පිලිවෙලටද මේක හදිසි කාරණාවක් මත ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ. පරිපාලනමය වශයෙන් ඇතිවෙලා තිබෙන අඩුපාඩු මොනවද? ඒවා ගැන වහාම අපේ අවධානයේ යොමු කල යුත්තේ මොකද? ඒහෙම නොකලොතින් අපි කොයි තැනටද යන්නේ? කියන ඒක කියන්න ඔබතුමාගෙන් අපිට යම් අවස්ථාවක් ලැබෙන්න ඕනා. ගරු නගරාධිපතිතුමනි, මම නැවත වරක් කියනවා මේකේ යටි අරමුණ ඔබතුමාට ඔය ගහන්නෙයි කියන එක නම්

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,මට ගහන ඒක ප්‍රශ්ණයක් නැහැ ඒකට මම බය නැහැ. මෙය යම් කටයුත්තක යෙදෙන දෙයක් එහෙම නැතුව මට ප්‍රශ්ණයක් නැහැ. මම මෙතන යම් අගතියක් වෙයි කියලා කල්පනා කරලා තියෙනවා. හැබැයි ඔබතුමාලට පුලුවන් මෙන්න මේ වගන්තියේ විදියට අපි ඌ වගන්තියට දැම්මා. ඒ සම්බන්ධයෙන් යම් කිසි තීරණයක් ගන්න ඔබතුමන්ලාට ඒ අදාල වෙන්නාවූ කටයුතු කරන්න ඒහෙම නැත්නම් ඔබතුමන්ලාට පුලුවන් මේ යෝජනාවට යම්කිසි අගතියක් වෙනවා කියන යෝජනාවට 09 වෙනි මාසේ 03 වෙනිදා අධිකරණ තීන්දුවෙන් පසුව පුළුවන්. මම ඒතකොට භාර ගන්නම්.

## 06. 2021 මැයි මස ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.

### 06(1) 2021.05.20 දින පැවැති මුදල්  පිලිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රී  - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටුවේ කාරණා කීපයක් තියෙනවා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. 39 පිටුවේ අංක 19 කරුණ මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත මුදල දහනමලක්ෂ පනස් දහස් තුන්සිය අසූදෙකයි ශතපනහයි. නාගරික ඉංජිනේරු විසින් නිර්දේශ කරනවා ගෙවන්න දහනමලක්ෂහැත්තැමදහස් අටයි ශත හැත්තැපහක් මෙතන සටහනේ තිබෙනවා, මෙහෙම ගිවිසුම් ගත මුදලට වඩා වැඩ කල ප්‍රමාණය අඩු බැවින් ගෙවීම අඩු වුනා කියලා. මේ වැඩියෙන් ගෙවලනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු ඉංජිනේරුතුමිය මේ සම්බන්ධව ලබාදෙන පිළිතුර මොකක්ද?

<u>මහ නගර සභා මන්ත්‍රී  - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා,ඊලඟට අංක 19(8) බලන්න. මේවාට නගරාධිපතිතුමා, කොමසාරිස්තුමා, ඉංජිනේරු තුමිය මේවට අත්සන් කරනවා. ගිවිසුම් ගත මුදල ලක්ෂ දහඅටයි දෙසියපනස් තුනයි ශත පනස්තුනයි. ඉංජිනේරුතුමිය නිර්දේශ කරනවා  දහඅට ලක්ෂ එකොලොස් දහස් හාරසිය පනස් අටක්. ගිවිසුම් ගත මුදලට වඩා වැඩියි සටහනේ දානවා ගිවිසුම් ගත මුදලට වඩා ඉටු කල ප්‍රමාණය  අඩු බැවින් ගෙවීම අඩුයි. අඩුවෙන් වැඩ කලාම වැඩියෙන් ගෙවන ඒකක්ද මේ කරන්නනේ?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු ඉංජිනේරුතුමිය, මෙම  ලිපිගොනුව ගෙනල්ල නිදොස් කරන්න ඉක්මනට.මෙතන සිදුවෙන්න ඕන වැඩි බැවින් කියන ඒක.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, එකක් දෙකක් නොවෙයි ඔක්කොම ඒහෙමයි. සමහර ඒවායේ වෙනස් කම් තියෙනවා. මේ සභාවක මුදල් කමිටුව පිලිබඳව අපි ප්‍රශ්න කරනකොට උත්තර දෙන්න බැරිනම්, මුදල් පිලිබඳව මහජන නියෝජිතයො කොහොමද අත උස්සන්නේ. මේවා කියවලා බලලා නොවෙයි ද මේවා මුදල් කමිටුවට ඇතුලත් කරන්නේ. ගරු නගරාධිපතිතුමා 19(14) බලන්නකෝ හැම සටහනකම තියෙන වචනවල තේරුම් තියෙනවා. ගිවිසුම් ගත මුදලම ගෙවල කියනවා ඉටු කල වැඩ ප්‍රමාණය අඩුයි. ඒම නිසා ගෙවීම අඩුයි කියලා. පොඩි ළමයගේ මොන්ටිසෝරි පොත මෙහෙම නැහැනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු ඉංජිනේරුතුමිය, අපි ඒකක් අරගෙන බැලුවා. ඔබ ලියලා තියෙන්නේ අඩු බැවින් කියලා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,මේ සභාව පිලිබඳ මොකක්ද ඔබතුමියලට තියෙන වගකීම. මේ සභාවේ මන්ත්‍රීවරු අත් උස්සන්නේ මේවට. අපිට විරුද්ධ වෙන්න පුලුවන් දේශපාලන වශයෙන්.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු ඉංජිනේරුතුමිය, ඔබතුමිය පිලිගන්න මෙතුමා කියන එක. එතන තියෙන්නෙත් නමලක්ෂ අසූපන්දහස් හැටහතරයි ශත අසූතුනයි හැබැයි එතන ගෙවලා තියෙන්නේ නමලක්ෂ හැත්තැපන්දහයි එතන තියෙන්නේ අඩු ප්‍රමාණයක් මේවා ගැලපෙනවා අඩුයි. සමහර තැන්වල අඩු ඒකට අඩුයි කියලා දාලා තියෙනවා.මෙතන සමහර තැන් වල අඩු ඒකට වැඩියි කියලා දාලා තියෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,වැඩි ඒකට වැඩියි කියලත් දාලා තියෙනවා. 19(18) ගිවිසුම් ගත මුදල දාහතර ලක්ෂහතලිස් හතරදහස්හත්සියහැත්තැවයි ශත විසිපහක් නිර්දේශ කරනවා ගෙවන්න දහතරලක්ෂ අසූදෙදහක් හැබැයි අරකම කියනවා ගිවිසුම් ගත මුදලට වඩා වැඩ කල ප්‍රමාණය අඩුයි. වැඩියෙන් ගෙවනවා අඩුවෙන් ගෙවුවා කියලා කියනවා. අනිත් ඒක 19(23) ගිවිසුම් ගත වුනේ දාහතරලක්ෂහැත්තැහය දහස් හයසිය පනස්එකකට නිර්දේශ කලා ගෙවීම පහලොස් ලක්ෂඅනූහතරදහස් නවසිය හැත්තැවක් සටහන දැම්මා ගිවිසුම් මුදලට වඩා ඉටුකලවැඩ ප්‍රමාණ ය අඩු බැවින් ගෙවීම අඩු කර ඇත. මේවා තේරෙන්නේ නැත. ඒහෙම වෙන්න බැහැනේ.සටහන කියවන්නකෝ. අඩුවෙන් වැඩ කලා කියලා කියන්නේ ගිවිසුම් ගත මුදලට වඩා අඩුවෙන්. මේ වැඩියෙන් ගෙවලනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා 19(18) මම ඉංජිනේරුතුමියගේ අවධානයට යොමු කරනවා ව්‍යාපෘති ඇස්තමේන්තු මුදල දහහතර ලක්ෂ හතලිස්පන්දහස් හසිය දාහතයි ශත අසූහතරයි. ඒ ඇස්තමේන්තු මුදල ගිවිසුම්ගත මුදල දහහතර ලක්ෂ හතලිස්හතර දහස් පන්සිය හැත්තැවයි ශත විසිපහයි. ගිවිසුම් මුදලට වඩා ඉටුකල වැඩ ප්‍රමාණය අඩු බැවින් මුදල අඩුවී ඇත. මේ සියලුම දේවල් නිවැරදි කරන්න අපිට අත උස්සලා සම්මත කරන්න තියෙන්නේ වැරදි කරුණුනේ.මුද්‍රණ දෝෂ නොවෙයි ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ලියලා එවලා තියෙන්නේ අඩු වැඩි කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා,සමහර ඒවායේ තියෙනවා වැඩියෙන් වැඩ කල නිසා වැඩියෙන් ගෙව්වා කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,මේ සම්බන්ධයෙන් තියෙන කාරණා සියලු දේට අපිට අත උස්සන්නත් බැහැ මේක නිවැරදි වෙන්න ඕනෑ. මුදල් කමිටුවේ අංක 19 (01) සිට 19(36) දක්වා වූ කරුණු ඉවත් කර මුදල් කමිටුව අනුමත කරමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා,අපි හැමෝම වගකියන මුදල් කමිටුව. නගරාධිපතිතුමනි අපි හැමෝම අනුමත කරලා වාහන ප්‍රමාණයක් ගත්තනේ දන්න විදියට මේ වාහන වලට අත්තිකාරම් මුදලක් ගෙවුවා හැබැයි මේ මිල ගනන් කැඳවීමවත්අඩුම තරමේ මේ සභාවට ආවේ නැහැ. මේ ගනුදෙනුවල තිබෙන විනිවිද භාවය ඉතා වැදගත්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා ,ඊලඟ කමිටුවට ඉදිරිපත් කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අංක 23 කොවිඩ් වලින් මියයන අයට අවමංගල සේවා පහසුකම්සැලසීම.අපි කවුරුත් කථා කරලා මගේ ජීවිතයේ මේ සභාව ගත්තු හොඳ තීන්දුවක්.ඔබතුමාම මට කථා කරලා කිව්වා පානදුර මල් ශාලාව තමයි ඉතාම අඩුවෙන් කටයුතු කරන්නේ ඒ නිසා පානදුර මල් ශාලාවේ කට්ට පෙට්ටිය දෙනවා රු.7000/- ට කියල. මට කවුරු කලත් කමක් නැහැ. දැන් සඳුන් ඒක කරනවා. දැන් අපි මේ වෙනකොට සැලකිය යුතු දේහයන් ප්‍රමාණයක් සභාව අරගෙන කලා. අඩුම තරමින් මේ වෙනකෙට මේ වාර්තාවට එන්න ඕනනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා. එන්න බැහැනේ දැන් ඔබතුමා මේ සම්බන්ධයෙන් කථා කරන එක සුදුසුම නැතිවෙයි කියලා හිතනවා. මම කියන හේතුව මම රු.12000/- කට උපරිමයකට ගිහිල්ලා මේ කටයුත්ත කරන්න කියලා සභාව තමයි තීන්තු කලේ. අපි කථා කලාම හර්ස් එකටයි පෙට්ටියටයි රු.15000/- ක් යනවා පානදුර මල් ශාලාවට. අපිට සඳුන් මල් ශාලාවෙන් කිව්වා පෙට්ටියටයි හර්ස් ඒකයි දීලා ඒගොල්ලෝ රු.10000/- ට කරනවා කියලා. සභාව උපරිමය මෙච්චර යන්න කිව්ව වෙලාවේ ඒක අපි තව රු.3000/- ක් අඩුකරගෙන කරපු ඒක විතරයි අපි කලේ. ඒ වෙලාවේ මිනිස්සුන්ව අපහසුවට පත් කරන් නැතුව අපි තීන්දුව ගත්ත දවසෙම ක්‍රියාත්මක කලා. ඒ වෙලාවේ මිල ගනන කැඳවා කැඳවා කරන්න ඕන වෙලාවක්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි සත්භාවයෙන් කරන්න ඕන කටයුත්ත කලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ කියන්නේ දොස් නොවෙයි. සභාවේ මහජන මුදල් වියදම් කිරිමේදි විනිවිද භාවයන් අපි ආරක්ෂා කර ගත යුතු නිසා මල් ශාලාව කවුද අපිට අදාල නැහැ හැබැයි දැන් අපි වැඩකලා ඒ අය එක දේහයක් වෙනුවෙන් අපෙන් අය කරන මුදල කීයද කියන ඒක පිලිබඳව

අපි කියනවා 15000/- ට යටත් කියලා. ඒ කියන්නේ අපි.වෙන වෙන අයගෙන්න ගන්න බැරිනම් ඒගොල්ලන්ගෙන් අරගෙන කියන්න ඒක දේහයක් වෙනුවෙන් යන මුදල.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා මට ඔබතුමාට මෙහෙම දෙයක් කරන්න පුලුවන්. අපි හිටපු නගරාධිපති රවිනාත් ගුණසේකර මැතිතුමාට කලා වගේ රු.16000/- යි කියන ඒක රු.15000/- ට කරලා 30000/- ක් ඉතුරු කලා. හෙට කාටහරි කියන්න පුලුවන් නම් කොහේ හරි මල් ශාලාවක් 9900/- යි කියලා අපි එතනට යනවා.තව කවුරු හරි කිව්වොත් 9500/- යි කියලා අපි එතනට යනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමාගේ අදහස හොඳයි. විවෘතව ඒක තියන්න .මම කියන්නේ මේක මෙහෙම වෙද්දි අපිට පොඩි අවබෝධයක් හැදෙන්න ඕනනේ ඔබතුමාම මට කියපු නිසා.නැවත වරක් මට කිව්වේ නැහැ.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා තැන නොවෙයිනේ මුදලනේ වැදගත් වෙන්නේ. මට කියන්න උවමනාවත් තිබුනේ නැහැ.මම යන්නේ 15000/- ට උඩින් නොවෙයි නේ. මම යන්නේ 5000/- ක් අඩුවෙන්.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා,මම ප්‍රශ්ණ කරන්නේ ඔබතුමා 7000/-ට පෙට්ටිය කියපු නිසා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා 7000/- ට පෙට්ටිය විතරයි.හර්ස් එකට වෙනම. දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ පෙට්ටිය 4500/- යි හර්ස් එක 5500/-

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඒ සම්බන්ධව මුදල් කමිටුවට හරි වාර්තාවක් එවන්නකො. කෝවිඩ් නිසා අසරණ වුන වෙළඳ ප්‍රජාවක් ඉන්නවා අපේ කඩවල මාසයක් වහලා තිබුනා. එම කඩ වලට අදාල දඩ අය කරන්න එපා කියන ඒක තමයි ඉල්ලා සිටින්නේ

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා අපි ඒක තීරණය කරලා ඉවරයි. සියලුම දඩ අය කිරීම වෙළඳ බලපත්‍ර වලින් ඉවත් කිරීමට ගන්නා ලද තීන්දුව

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා,මාසයට අදාල කුලිය අයින් කර ගන්න බැරිද අපිට.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා කුලිය අයින් කර ගන්න බැරිවෙයි සභාවට.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඒ පිලිබඳ පැහැදිලි කිරිමක් කරන්න අපි දන්නේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ කොවිඩ් තත්ත්වය නිසා දඩ මුදල කොමසාරිස්තුමා කිව්වා ඊට පසුව කලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, දඩ මුදල අයින් කිරිම තුලින් සභාවට අහිමි වන මුදල් ප්‍රමාණය කොපමණද කියලා සභාවට කියන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ඔබතුමිය අහන්නේ කර කියා ගන්න බැරිම ප්‍රශ්ණයක්.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, තින්දුවක් ගන්නවා නම් මොකක් හරි නිර්ණායකයක් තියෙන්න ඕන. ඔබතුමා ඒ වගේ තීන්දුවක් ගන්වානම් වාර්තාවක් බලන්න ඕන කොපමණ මුදලක් සභාවට අහිමි වෙනවද කියලා. ඒක අපි පියවා ගන්න ඕනා. එහෙම ලේඛණයක් තියෙනවද.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය දඩ මුදල් කියන ඒක සභාවට ලැබෙන මුදලක් මිසක් අඩු වෙන මුදලක් නොවෙයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, පසුගිය අවුරුදු වලට සාපේක්ෂව දඩ මුදල් වලින් අඩු වෙන ප්‍රමාණයක් තියෙනවානේ එතකොට මෙවැනි තීන්දුවක් ගන්නවානම්?

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ලිහිනි මන්ත්‍රීතුමිය කියන්නෙත් ගත්තු තීන්දුව අපි මහජන නියෝජිතයෝ විදියට දැනගන්න ඕන ගරු මන්ත්‍රීතුමා. මේ වෙනකම් අපි දැනගෙන තිබුනේ නැහැනේ ඔබතුමා ගත්තු තීන්දුව ප්‍රායෝගිකව හරි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු කොමසාරිස්තුමා තමයි 254 අ වගන්තියේ යටතේ මුදල් ලබාගැනිම ගිවිසුම් අත්සන් කිරිමේ බලධාරියා. එතුමා මට ලිපියක් එවනවා මේ තත්වය නිසා මේ කාලය තුල මේකට මට අවසර දෙන්න කියලා ඒ ලිපියට මම අවසර දෙනවා. 254 වගන්තිය යටතේ කිසි දේකට සභාවට නගරාධිපතිවරයාට ඇඟිලි ගහන්නට බැරි ආදායමක් උපයන නිලධාරියා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා කරපු වැඩේ හරි අපි මහජන නියෝජිතයෝ විදියට කමිටුවලට සහභාගිවන අය හැටියට අපිව දැනුවත් කරන්න.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු ලිහිනි මන්ත්‍රීතුමිය අහන්නේ මොකක්ද.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා ඔබතුමාගේ තීරණයට අභියෝග කිරීමක් නොවෙයි මෙතන කියන්නේ ඔබතුමා ඔය වගේ තීන්දුවක් ගන්වානම් මොකක් හරි බේසික් ඒකක් තියෙන්න ඕන. මේ මුදල අපි අඩු කරනවා ඒක අපි දැනගන්න ඕන.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු ලිහිනි මන්ත්‍රීතුමිය, දඩ මුදල් කියන්නේ බජට් කරන ඒකක් නොවෙයි. ඒක නිශ්චය කරන්න බැහැ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම සභාවෙන් ඉල්ලා සිටිනවා කොවිඩ් නිසා හරියටම මාසයක් කඩ වහලා.ආදායමක් නැහැ.මීට පෙර කොවිඩ් නිසා වහපු කාලේ අපි කඩවලට කුලී සහනයක් දුන්නා. මම ඉල්ලා සිටිනවා සභාව විදියට මුදල් කමිටුවට ඔවුන්ගේ ඉල්ලීම ඉදිරිපත් කරලා පුලුවන් නම් කුලී මුදල අපිට ඉවත් කරන්න පුලුවන් නම් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒසේ කරමු කියලා කියමින් මුදල් කමිටුවේ ව්‍යාපෘති වල තත්වය ඉතාම වැරදි සහගත නිසා මුදල් කමිටුවේ ගෙවීම් තිබෙන ඒ සියල්ලට අපේ විරෝධය පල කරනවා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද ගෙවීම සම්බන්දයෙන් අඩු වැඩි කියන වචනය හේතුකරගෙන තියෙන්නා වූ මුදල් කමිටු වාර්තාවේ අංක 19 (01) සිට 19(36) දක්වා කරුණු ඉවත් කිරීමට යටත්ව මුදල් කමිටුවට ඡන්දය විමසනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටුවේ 9 වන කරුන අධිහාරය සම්බන්ධව අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. නගරාධිපතිතුමනි පැහැදිලි කිරීමක් අවශ්‍යයි 22 කරුණ සම්බන්ධයෙන් ඔබතුමා යෝජනාවක් කරලා තියෙනවා මේ පොල් කට්ටත් වරිපනමට කියලා ව්‍යාපෘතියක් ඒ ඇමුණුමේ සඳහන් වෙනවා රු.400/- ගානේ අය කරනු ලබන නිවාස 12000 ක් තියෙනවා කියලා. ඒ 12000 සම්බන්ධයෙන් අහිමි වන මුදල වෙන්නේ මිලියන 4.8 ක්. වාර්තාවේ දාලා තියෙන්නේ ලක්ෂ 8 යි කියලා. එතකොට මිලියන 4.8 ක් අහිමි වීම තුල ඔබතුමා ඒ මිලියන 4.8 පියවා ගන්න බලාපොරොත්තු වෙන්නේ

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, රු.400/- ට අඩු වුනාම, රු.98/- ගෙවන අයත් ඉන්නවා සභාවට. ඒ ඔක්කොම එකතුව තමයි ඔය.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම කියනවා ඒ සම්බන්ධව සභාවට පැහැදිලි කිරීමක් කරන්න කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒක තමයි මම කියන්නේ මුදල් කමිටුව නියෝජනය කරන්න කියලා.ඔබතුමියලා හිතන්නේ සභාව දවස විතරයි නගර සභාවේ දවස කියලා.නමුත් කමිටු දවසුත් තියෙනවා. ඒතුමිය නීතිඥ වරියක් වුනාම නීතිය හා ගණකාධිකරණය ඒ දෙකම දන්නවා. නමුත් ඒ දෙකම නොදන්නා විදියට තමයි හැසිරෙන්නේ සභාව තුල. ඒක හරි කණගාටුවක්. ඒක නිසා ඔබතුමිය හරි කමක් නැහැ මුදල් කමිටුවට එන්න වෙන කෙනෙක් ව අයින් කරගෙන. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමිය මේකේ අහිංසක ජනතාව ඉන්නවා අද පොල්කටු කිලෝ ඒකක් ගන්නවා නිවසට ඇවිල්ලා වටිනාකමක් දිලා. ඒ නිසා වටිනාකමක් දුන්නට පස්සේ අපිට පුලුවන් කමක් නැහැ මේ අසරණ මිනිස්සු වරිපනම් අය කිරීමේදි අපිටත් බරපතල ප්‍රශ්ණ මතුවෙලා තියෙනවා. ඒ නිසා අපි තීරණය කලා පොල්කට්ට අරගෙන වරිපනම් වලින් නිදහස් කරන්න. ඒ නිදහස් කිරීම කරන්න අපිට සිද්ධ වෙනවා. ඒක තමයි මෙකේ අවසාන වශයෙන්ම අපි බැලුව කරන්න ඕනා මොකද්ද කියලා.මේක හොඳ යෝජනාවක් විදියට තමයි කවුරුත් දැක්කේ නිශාන්ත මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් බොහොම උනන්දුවකුත් තිබුනා. එතුමා ඇහුවා අපි එදා සවිස්තරාත්මකව විස්තර කිව්වා.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා,මුදල් කමිටුවේ ඉවත් කරන කරුනු වලට ඒකඟ වෙමින් මුදල් කමිටුවේ 9 වෙනි කරුණට විරුද්ධ වෙනාවා ඉතිරි ඒවට පක්ෂයි.

**2021.05.20 දින පැවැති මුදල් පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ අංක 19 (1) සිට 19 (36) දක්වා කරුණු හැර අනෙකුත් සියලුම තීරණ වලට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |

10. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය

**2021.05.20 දින පැවැති මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 19 (1) සිට 19 (36) දක්වා කරුණු හැර අංක 09ට විරුද්ධවත් අනෙකුත් සියලුම තීරණ වලට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදී.**

01. මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
05. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
07. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
08. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

**2021.05.20 දින පැවැති මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 19 (01) සිට 19 (36) දක්වා කරුණු හැර අනෙකුත් සියලුම තීරණ වලට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදී.**

01. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා

**2021.05.20 දින පැවැති මුදල් පිලිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 19 (01) සිට 19 (36) දක්වා කරුණු හැර අනෙකුත් සියලුම තීරණ වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**07.** <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව -</u>

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි,2021.05.20 මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021මාර්තු හා අප්‍රේල් මාසයන් වලට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

**08.** **<u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> -**

**<u>08(1) මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසිනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, රටේ වර්තමාන තත්වය අනුව රටට අවශ්‍ය මොහොතක එක්සත් ජාතික පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පාර්ලිමේන්තු ආගමනයට මොරටුව එක්සත් ජාතික පක්ෂ ජනතාව වෙනුවෙන් මාගේ සහ ඒම ජනතාවගේ උණුසුම් සුභ පැතුම් පල කරනවා.

**09.** **<u>වෙනත් කරුණු</u>** - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.06.30 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.